www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යාපනයේ සසප රැස්වීමට එරෙහිව ප්‍රචණ්ඩත්වයේ තර්ජන

## Threats of violence against SEP meeting in Jaffna, Sri lanka

**සමාජවාදී සමානතා පක්ෂ විසිනි**

**2005 නොවැම්බර් 05**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) විසින් පසු ගිය ඉරිදා යාපනය තුල පැවැත්වීමට සැලසුම් කර තිබූ ජනාධිපතිවරන උද්ඝෝෂන රැස්වීම ප්‍රචණ්ඩත්වයේ තර්ජන හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. සසප පිලිවෙත් ශ්‍රවනය කිරීමෙන් ප්‍රාදේශීය ජනතාව වැලැක්වීම මෙම තර්ජනවල අරමුන විය.

නොවැම්බර් 17 ජනාධිපතිවරනය සඳහා සසපයේ දේශපාලනික ඉදිරි දර්ශනය සහ ක්‍රියා මාර්ගය සාකච්ඡා කිරීම උදෙසා ඔක්තෝබර් 30 වන දින සවස 2.30ට සමුපකාර සමිති ශ්‍රවනාගාරයේ දී රැස්වීම පැවැත්වීමට නියමිතව තිබින. මෙවර ජනාධිපතිවරනයට අපේක්ෂකයෙකු ඉදිරිපත් කර සිටින දේශපාලන පක්ෂ අතරින්, යුද්ධයෙන් ඉරිතැලුනු දිවයිනේ උතුරුකරයේ පිහිටි යාපනය තුල රැස්වීමක් පැවැත්වීමට මෙතෙක් සංවිධානය කර තිබුනේ සසප පමනි.

රැස්වීමට ප්‍රථම ශාලාවේ වැසූ දොරවල් මත දැන්වීමක් අලවා තිබූ අතර එහි මෙසේ සඳහන් විය. ''ශ්‍රී ලංකාවේ වත්මන් ජනාධිපතිවරනය වර්ජනය කරනු! ශ්‍රී ලංකාවේ ජනාධිපති අපේක්ෂකයන්ගෙන් කවරෙකුට හෝ ආධාර කිරීමට දෙමල ජනතාවට ඉඩක් නැත. පසු ගිය කාලයේ අත්දැකීම් අපට සෑහේ. ජනාධිපතිවරනයට ප්‍රචාරය ලබා දෙන කවර හෝ ක්‍රියාවක නොයෙදෙනු.''

සසපට සහ රැස්වීමට සහභාගීවන කවරෙකුට වුව නිසැක තර්ජනයක් වන මෙම දැන්වීමෙහි තව දුරටත් මෙසේ සඳහන් වේ: ''මෙය අනතුරු ඇඟවීමකි. අපේ උපදෙස් නොතකා යමෙකු එවන් ක්‍රියාවක යෙදෙන්නේ නම් මක්කල් පඩෙයි (ජනමහජන හමුදාව) නියම පිලිතුරක් ලබා දෙනු ඇත.'' පැහැදිලිව ම, මක්කල් පඩෙයි යනු තර්ජකයන්ගේ නියම අනන්‍යතාව වසන් කිරීම සඳහා යොදා ගත් ව්‍යාජ නාමයකි.

රැස්වීම් දින උදෑසන ශාලාව භාරකරුගේ නිවසට ගිය තරුනයන් දෙදෙනෙක් ශාලාව විවෘත නොකරන ලෙස ඔහුට තර්ජනය කලහ. පසුව, රැස්වීමට සහභාගිවීම සඳහා පැමින ශාලාවෙන් පිටත රොක් වී සිටි ජනයා වෙතට වයිසර සහිත හෙල්මට් පැලැඳි තරුනයන් දෙදෙනෙක් පැමිනියහ. ජනයා වටා තම යතුරු පැදිය පැද වූ ඔවුහු ස්ථානයෙන් ඉවතට ගියේ මෙසේ හඬ නගමිනි: ''රැස්වීම පැවැත්වුවොත් අපි ශාලාවට බෝම්බ ගහනවා.''

යාපනයේ ප්‍රචන්ඩ ප්‍රකෝපකාරිත්වයේ ඉතිහාසය සැලකිල්ලට ගනිමින් අකමැත්තෙන් වුව රැස්වීම නැවැත්වීමට සසප තීරනය කලේ ය. රටේ විසි අවුරුදු සිවිල් යුද්ධයේ කේන්ද්‍රස්ථානය ලෙස පවත්නා යාපනය නගරය දැඩි ලෙස සන්නද්ධ කෙරී ඇත. ආරක්ෂක හමුදාවන් විසින් ප්‍රාදේශීය දෙමල ජනතාව බලහත්කාරී ලෙස පාලනය කෙරෙන සහ පරීක්ෂාවට ලක් කෙරෙන මර්දනකාරී තන්ත්‍රයකට යටත් කොට පවතී. එල්ටීටීඊය ද නගරය තුල ක්‍රියාකාරී ය. යාපනය අර්ධ-ද්වීපයෙන් කොටසක් එය විසින් පාලනය කෙරෙන අතර දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යෙදීම සම්බන්ධයෙන් එල්ටීටීඊය කුප්‍රකට ය.

ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් වග කිව යුත්තේ එල්ටීටීඊය හෝ එහි ප්‍රමුඛ පෙලේ සංවිධානයක් වීමට මුලුමනින් ම ඉඩ ඇත. එල්ටීටීඊයට හිතවත් උසස් අධ්‍යාපන ආයතනයන්ගේ ශිෂ්‍ය සංගමය විසින් ඔක්තෝබර් 26 වන දා නිකුත් කරන ලද ප්‍රකාශයක් මගින් සියලු අපේක්ෂකයින් ''සිංහල'' යන අයුරින් වර්ගවාදී පදවලින් ජනාධිපතිවරනය හෙලා දැක එය වර්ජනය කරන ලෙස ඉල්ලා සිටියේ ය.

1998 දී, පක්ෂයේ ක්‍රියා මාර්ගය සඳහා උද්ඝෝෂනයේ යෙදී සිටි සසප සාමාජිකයින් සිව් දෙනෙකු එල්ටීටීඊය විසින් වන්නියේ දී අත් අඩංගුවට ගැනින. 2002 දී අම්පිහයිනගර් සහ කයිට්ස් දූපත්වල ධීවර සමුපකාර සමිතියක් ගොඩ නංවා එයට නායකත්වය ලබා දුන් සසප සාමාජිකයන්ට එල්ටීටීඊය විසින් මරන තර්ජන එල්ල කරන ලදී.

මෙවන් මැර ක්‍රියාවක්, සන්නද්ධ හමුදාවන් සමග සමීපව වැඩ කටයුතු කරන ඊපීඩීපී සංවිධානය වැනි සන්නද්ධ දෙමල සංවිධානයක ක්‍රියාවක් ද විය හැක. පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොටසක් වන ඊපීඩීපීය, හමුදාවේ ක්‍රමවේදයන්ට එරෙහිව උද්ඝෝෂනය කල සසප සාමාජිකයන්ට තර්ජනය කරමින් බාධා කලේ ය. 2000දී ඊපීඩීපී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් කයිට්ස් හි සසප සාමාජිකයන්ට කායිකව පහර දුනි.

එල්ටීටීඊය සහ එහි විරුද්ධවාදීන් යන දෙගොල්ල ම වාර්ගික දේශපාලනයේ ගැලී සිටින අතර සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම යටතේ සියලු -- දෙමල, සිංහල, සහ මුස්ලිම් -- කම්කරුවන් එකමුතු කිරීමට සටන් වදින

සසප ඉදිරි දර්ශනයට ගැඹුරින් ම විරුද්ධ ය. පැහැදිලිව ම, මක්කල් පඩෙයි තර්ජනයේ අරමුන වූයේ සිවිල් යුද්ධය නිමා කිරීමේ තම පන්ති ඉදිරි දර්ශනය අන්තර්ගත කර ගත් සසප දේශපාලනය පිලිබඳ කවර හෝ සාකච්ඡාවක් වැලැක්වීම ය.

විසි අවුරුදු යුද්ධයකට පසුව සහ කිසිවක් නොවිසඳුනු 2002 සටන් විරාමයේ සිට සාමාන්‍ය දෙමල ජනයාගෙන් බොහොමයක් විකල්ප විසඳුමක් අපේක්ෂාවෙන් සිටිති. එක්සත් ජාතික පක්ෂයට (යූඑන්පී) හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) -- ප්‍රධාන ධනපති පක්ෂ දෙකට -- යුද්ධයට හෝ වැඩෙන සමාජ අසමානතාවට කවර හෝ පිලිතුරක් නොමැත. වැඩ කරන ජනතාවගේ මූලික සමාජ අවශ්‍යතාවන්ට ආමන්ත්‍රනය කිරීම සම්බන්ධයෙන් එල්ටීටීඊය පෙන්වා ඇති අසමර්ථතාවය හා එක්ව එල්ටීටීඊයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා ගැඹුරු වන විරුද්ධත්වයක් පැන නංවමින් පවතී.

තර්ජනය සම්බන්ධයෙන් වග කිව යුත්තේ කවරෙකු වුව ද, සසප උද්ඝෝෂනය බලගතු දේශපාලන බලපෑමක් ඇති කරමින් සිටි බවට වූ උත්සුකයෙන් ඔවුන් මෙහෙයවුනු බැව් නිසැක ය. සසප විසින් සිය ගනනක් පෝස්ටර අලවමින්, දෙමලෙන් පල වූ ''දේශපාලන සාහිත්‍යය'' සහ පත්‍රිකා බෙදාහරිමින් කයිට්ස්, කරෙයිතීවු, සහ යාපනය නගරය තුල මත් ගෙයින් ගෙට යමින් උද්ඝෝෂනයේ යෙදුනි. මනා සහභාගිත්වයකින් යුත් ප්‍රාදේශීය රැස්වීම් කීපයක් සසප පැවැත්වූ අතර, සසප මධ්‍යම කාරක සභික ඇමැතීමට නියමිතව තිබූ ප්‍රධාන රැස්වීම් විස්තර ප්‍රාදේශීය පුවත්පත්වල වාර්තා විය.

රැස්වීම ආරම්භවීමට නියමිතව තිබූ වෙලාවට පෙර එයට සහභාගිවීමට හැට දෙනෙකු පමන ශාලාව අසලට පැමිනියහ. මෙම පිරිසට, ධීවරයින්, සීනෝර් කර්මාන්ත ශාලාවේ වෘත්තික කම්කරුවන්, ගෘහනීන් සහ තරුනියන් අන්තර්ගත වූහ. එල්ටීටීඊය මගින් පාලනය වන වන්නි ප්‍රදේශයෙන් ද සිව් දෙනෙක් පැමින සිටියහ. සිදු වූ දෙය සම්බන්ධයෙන් සියලු දෙනා ම කෝප වී සහ කලකිරී සිටියහ.

සසප සාමාජික රැස්ව සිටි පිරිසට මෙසේ පැහැදිලි කලේ ය: ''වැඩ කරන ජනතාව මුහුන දෙන ප්‍රශ්නයන් සම්බන්ධයෙන් කවර හෝ ගැඹුරු දේශපාලන සාකච්ඡාවකට බියවැදී සිටින ප්‍රතිගාමී බලයන්ගේ නිවට තර්ජනයක් නිසා අපට මෙම රැස්වීම නවතා දමන්නට සිදු වුනා.

''නිසැකව ම, දශක දෙකකට වැඩි සිවිල් යුද්ධයේ කටුක අත්දැකීම් පිලිබඳව සාකච්ඡා කිරීමට උතුරු හා නැගෙනහිර වැඩ කරන ජනතාවට කාලය පැමින තිබෙනවා. 2002 සටන් විරාම ගිවිසුමෙන් අරඹන ලද ඊනියා සාම ක්‍රියාදාමය කම්කරු ජනතාවට, විශේෂයෙන් ම දෙමල ජනතාවට, ඇටවූ උගුලක් බැව් වඩාත් පැහැදිලි වෙමින් පවතිනවා. ජාත්‍යන්තර බලයන්ගේ උදව්වෙන් මෙම ගිවිසුම ගෙන ආ යූඑන්පී ආන්ඩුව හෝ වත්මන් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආන්ඩුව හෝ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් කල කිසිවක් නෑ. මර්දනකාරී කොලඹ හමුදාව තව මත් උතුරු හා නැගෙනහිර රැඳී සිටිනවා.

''අතීත අත්දැකීම්වලින් තහවුරු වූ එක ම දෙය නම්, කොල්ලකාරී ජාත්‍යන්තර බලයන්ගේ අනුග්‍රාහකයෙකු වීමට බලාපොරොත්තුවන එල්ටීටීඊ පිලිවෙත මුලුමනින ම බංකොලොත් බවයි.'' රැස්වීමට සහභාගි වීමට පැමිනි සියලු දෙනාට ස්තුති කල කථිකයා සසප ජනාධිපති අපේක්ෂක විජේ ඩයස්ගේ උද්ඝෝෂනයට ක්‍රියාකාරීව සහයෝගය ඉල්ලා සිටියේ ය.

සමහරුන්ගේ අදහස වූයේ තර්ජනයට එල්ටීටීඊය වග කිවයුතු බවයි. කීප දෙනෙක් සසප සාමාජිකයන්ගෙන් මෙසේ ඇසූහ. ''දෙමල ප්‍රදේශවලින් ශ්‍රී ලංකා හමුදාවන් ඉවත් කිරීමට උද්ඝෝෂනය කරන මෙම පක්ෂයේ ප්‍රසිද්ධ රැස්වීමක් වලක්වාලන්නේ ඇයි?

1983 සිට යුද්ධයට නොකඩවා විරුද්ධ වූ එක ම පක්ෂය සසප සහ එහි පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය පමනකි. එහි අපේක්ෂක විජේ ඩයස් මෙම ජනාධිපතිවරනයේ දී උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම සහ කොන්දේසි විරහිතව ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් ඉවත් කිරීම සඳහා උද්ඝෝෂනය කරයි.

ඒ සමග ම, කම්කරු ජනතාවට එල්ටීටීඊයෙන් කිසියම් හෝ මාවතක් නො සැපයෙන බැව් සසප අවධාරනය කරයි. ඒ වෙනුවට එය දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා නියෝජනය කරයි. 2002 සිට, කම්කරු පන්තිය අන්‍යොන්‍ය වසයෙන් සූරා කෑම සඳහා විවිධ වූ කොලඹ ආන්ඩු සමග බලය බෙදාගැනීමේ උපාමාරුවක් ඇති කර ගැනීමේ උත්සාහයක එය යෙදී සිටී.

ඉන්දියානු උපමහාද්වීපය පුරා සහ ජාත්‍යන්තරව සමාජවාදය ස්ථාපිත කිරීමේ පුලුල් අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන්වදිනු වස් වර්ගය, භාෂාව සහ ආගම නොතකා සියලු කම්කරුවන් එකමුතු කිරීමට සසප උද්ඝෝෂනය කරයි.

අප පක්ෂයේ ඉදිරි දර්ශනය සහ පිලිවෙත් ප්‍රසිද්ධියේ සාකච්ඡා කිරීමට අපට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට එල්ල කෙරී ඇති මෙම ප්‍රහාරය හෙලා දකින ලෙසත්, නොවැම්බර් 17 පැවැත්වෙන ජනාධිපතිවරනය සම්බන්ධයෙන් අප ගෙන යන උද්ඝෝෂනයට ආධාර කරන ලෙසත් සමස්ත දිවයිනෙහි තරුන ජනයාගෙන්, කම්කරුවන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org